# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2190/20 – 2020 අගෝස්තු 24 වැනි සඳුදා – 2020.08.24**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම්, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, ඒවා ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය, සමරකෝන් මුදියන්සේලාගේ චන්ද්‍රසේන වන මම මෙයින් ප්‍රකාශ කරමි.

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, ගලිගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කදුපිට පත්තුව දකුණ සුළු කොට්ඨාසයේ, අංක 60බී, ලාහුපන ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, තැඹිලිපිටිය ගමේ පිහිටි සර්වේයර් ජනරාල්ගේ අංක කේජී/ජීඑල්ජී/2018/152 හා 2018.12.17 වැනි දිනැති ප්‍රගමන අනුරේඛනයේ පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයෙන් යුත් ඉඩම් කැබලිවලට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – හිග්ගොඩවත්ත – ප්‍රමාණය: හෙක්. 2.9770**
උතුරට: මු.පි.කෑ. 3614හි කැබලි අංක 109, මෙම පිඹුරේ කැබලි අක්ෂර බී, මු.පි.කෑ. 3613 හි කැබලි අංක 14, මු.පි.කෑ. 3614 හි කැබලි අංක 102 සහ 101, මෙම පිඹුරේ කැබලි අක්ෂර සී, මු.පි.කෑ. 3613 හි කැබලි අංක 12, මු.පි.කෑ. 3614හි කැබලි අංක 96 සහ ප්‍රාදේශීය සභා මාර්ගය; නැගෙනහිරට: ප්‍රාදේශීය සභා මාර්ගය; දකුණට: ප්‍රාදේශීය සභා මාර්ගය සහ හිග්ගොඩවත්ත; බටහිරට: හිග්ගොඩවත්ත.

02. **කැබලි අක්ෂර 'බී' – ප්‍රමාණය: හෙක්. 0.0560**
උතුරට: මු.පි.කෑ. 3613 හි කැබලි අංක 14, මු.පි.කෑ. 3614හි කැබලි අංක 102 සහ මෙම අනුරේඛනයේ කැබලි අක්ෂර ඒ; නැගෙනහිරට සහ දකුණට: කැබලි අක්ෂර ඒ; බටහිරට: කැබලි අක්ෂර ඒ සහ මු.පි.කෑ. 3614හි කැබලි අංක 109.

03. **කැබලි අක්ෂර 'සී' – ප්‍රමාණය: හෙක්. 0.0201**
උතුරට: කෑ. 3613 හි කැබලි අංක 12, මු.පි.කෑ. 3614හි කැබලි අංක 96 සහ මෙම අනුරේඛනයේ කැබලි අක්ෂර ඒ; නැගෙනහිරට, දකුණට සහ බටහිරට: කැබලි අක්ෂර ඒ.

04. **කැබලි අක්ෂර 'ඩී' – හිග්ගොඩවත්ත – ප්‍රමාණය: හෙක්. 0.2664**
උතුරට: මු.පි.කෑ. 3613හි කැබලි අංක 10 සහ පොලදන්ඩ පිල්ලෑව; නැගෙනහිරට: පොලදන්ඩ පිල්ලෑව; දකුණට: හිග්ගොඩවත්ත සහ ප්‍රාදේශීය සභා මාර්ගය; බටහිරට: ප්‍රාදේශීය සභා මාර්ගය.

එස්. එම්. චන්ද්‍රසේන,
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය.

මගේ අංකය: 4-3/15/2017/වීඊ/521.
2020 මාර්තු මස 12 වැනි දින,
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
"මිහිකත මැදුර", රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

09 - 193



ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*